මගේ අංකය
எனது இல.
My No. සිඕටී/ඒ/එස්එල්ටීබී/එෆ්ඒ/2025/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2026 ඔක්තෝබර්ලදින

සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2025 දෙසැම්බර් 31 දිනට සකසන ලද අවසන් ගිණුම් තුළ පවත්නා වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ එකතු වටිනාකම රු.207,001,312 ක හඳුනාගත නොහැකි ගිණුම්කරණ සටහන් හේතුවෙන් හටගත් ණයහිමි ශේෂ 15 ක් පැවතීම හේතුවෙන් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය එම වටිනාකමින් සාවද්‍ය ලෙස වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට මණ්ඩලයට එරෙහිව ගොනු කර තිබූ නඩු කටයුතු 03 ක නඩු තීන්දු අනුව රු.4,207,155 ක මුදලක් අගතියට පත් වූ පාර්ශව වෙනුවෙන් ගෙවීමට නියම වී තිබුණ ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 (LKAS 10) ට අනුකූල වෙමින් මෙම ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට මණ්ඩලයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද සුළු මුදල් ඌණතාවය පාඩුවක් ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති සමුච්චිත අලාභය රු.752,244 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අධිවේගී මාර්ග ප්‍රවාහන පුද්ගලික සමාගමේ කටයුතු අවසන් කිරීමේදී සමාගම සතු බස් රථ 20 ක් තක්සේරු වටිනාකම රු.109,400,000 කට මණ්ඩලයට පවරාගෙන තිබුණ ද දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 07 වන වගන්තිය ප්‍රකාරව එම ශේෂය දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට සහ සමාගම සතුව පැවති වගකීම් වලින් තවදුරටත් ගෙවීමට තිබූ රු.25,184,850 ක වටිනාකම වගකීමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් වත්කම් රු.109,400,000 කින් සහ වගකීම් රු.25,184,850 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 (SLFRS 09) ප්‍රකාරව හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කළ යුතු වූවද සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.701,814,569 ක් වූ ණයගැති ශේෂය තුළ වසර 10 ට වැඩි රු.6,221,732 ක් ද, වසර 05 ත් 10 ත් අතර රු.19,101,052 ක් ද, වසර 02 ත් 05 ත් අතර රු.15,231,594 ක් ද, වසර 01 ත් 02 ත් අතර රු.18,839,681 ක් ද සහ වසරකට වඩා අඩු රු.642,420,510 ක ශේෂයක් පැවතියද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අමතර කොටස් මිලදී ගත් සමාගම් 02 ක් වෙනුවෙන් එම සමාගම් වෙත ගෙවීමට තිබූ රු.382,391,088 ක හා රු.66,043,266 ක ශේෂ සමාලෝචිත වර්ෂයට පෙර නිරවුල් කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශන තුළ එය නොගලපා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය රු.448,434,354 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) එක් ණයගැතියෙකුගේ සහ ණයහිමියන් 10 දෙනෙකුගේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය, ශේෂ සනාථන අනුව ශේෂය ඉක්මවා පිළිවෙලින් රු.58,042,588 ක් සහ රු.446,927,504 ක් වැඩියෙන් අවසන් ගිණුම්වල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු පොලී රු.10,072,659 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පාරිතෝෂික සඳහා වෙන් කිරීම ප්‍රධාන කාර්යාලයේ ගිණුම් තුළින් ගලපා තිබුණ ද බදුල්ල ඩිපෝවේ උපචිත වියදම් තුළ 2018 වර්ෂයේ සිට පැවත එන රු.288,246,841 ක පාරිතෝෂික සඳහා වෙන් කිරීමේ ශේෂයක් වාර්තා කර තිබීම හේතුවෙන් උපචිත වියදම් ශේෂය හා සමුච්චිත අලාභය එම වටිනාකම්න් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයෙහි වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ සහ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂය තුළ මණ්ඩලයෙහි අභ්‍යන්තර ආයතන අතර සිදුවූ අන්තර් ගණුදෙනු හේතුවෙන් හටගත් පිළිවලින් රු.13,742,961 ක සහ රු.94,077,869 ක ශේෂයන් පැවති බැවින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය සහ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂය එම වටිනාකම් වලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන තුළ රු.24,738,793 ක ලැබිය යුතු ආදායම් ශේෂයක්ද, රු.29,068,794 ක විවිධ ණයගැති ශේෂයක්ද, රු.443,211 ක වෙනත් ණයගැති ශේෂයක්ද, රු.75,166 ක වෙළඳ ණයගැති ශේෂයක්ද වශයෙන් එකතු වටිනාකම රු.54,325,964 ක් වූ හඳුනාගත නොහැකි ශේෂ ඇතුළත්ව තිබුණි. ඉන් රු.21,881,864 ක් වසර 02 ත් 05 ත් අතර ද, රු.10,926,668 ක් වසර 05 ත් 10 ත් අතර ද, රු.21,517,432 ක් වසර 10 ඉක්මවාද පැවතුණි. මෙම ලැබිය යුතු ශේෂය සම්බන්ධ තහවුරු කිරීමක් හෝ ශේෂ

සනාථන විගණනයට ඉදිරිපත් නොවුණි. තවද මෙම වටිනාකම් සඳහා හානිකරණ වෙන් කිරීම් ද සිදු කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන තුළ රු.49,918,777 ක් වූ මාර්ගස්ථ මුදල් ශේෂය තුළ වසර 02 ත් 05 ත් අතර කාලයක් පැරණි රු.16,105,286 ක් ද, වසර 05 ත් 10 ත් අතර කාලයක් පැරණි රු.978,597 ක් ද, වසර 10 ට වැඩි කාලයක් පැරණි රු.34,848,952 ක් ද පැවතුණි. එමෙන්ම ඩිපෝවන් 03 ක සහ එක් ප්‍රාදේශීය කාර්යාලයක රු.20,673,083 ක මාර්ගස්ථ මුදල් සෘණ ශේෂ ද පැවතුණි. මෙම මාර්ගස්ථ මුදල් ශේෂ භෞතිකව නොපැවතියද එම ශේෂයන්ගේ පැවැත්ම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඕ) මණ්ඩලය තුළ ක්‍රියාත්මක වන රියදුරු අභ්‍යාස විද්‍යාල 22 ක් සතුව පවත්නා රක්ෂිත වටිනාකම රු.20,150,000 ක් වන ත්‍රිරෝද රථ 17 ක්, රු.46,500,000 ක් වන වෑන් රථ 11 ක් සහ රු.5,470,000 ක් වන යතුරු පැදි 18 ක් අවසන් ගිණුම් තුළ ගිණුම්ගත කර නොතිබුණි. එම හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණ නියමිත වටිනාකමට වඩා අඩුවෙන් දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය වෙත ලද රජයේ ප්‍රදානයන්ගෙන් රු.1,554,414,000 ක් වැය කර ධාවනයෙන් ඉවත්ව තිබූ බස් රථ පුනරුත්ථාපනය කර තිබූ අතර එම පුනරුත්ථාපනය හේතුවෙන් බස් රථවල ඵලදායී ජීවකාලය ඉහළ ගියද එම පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණු බැවින් වසරේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර දේපළ, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඛ) City Bus ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.639,750 ක් වටිනා GPS Trackers 30 ක් සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට භෞතිකව නොතිබුණු බැවින් දේපළ, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබූ අතර ඒ සඳහා හානිකරණ වෙන් කිරීමක් ද සිදු කර නොතිබුණි.

(ග) 2019 වර්ෂයේදී එකක් රු.269,031 ක් බැගින් GPS කැමරා 125 ක් මිලදී ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් දිනට සකස් කර තිබූ වත්කම් ලේඛනයේ හා අවසන් ගිණුම්වල GPS කැමරා 98 ක් පමණක් ඇතුළත් කර තිබුණි. එම නිසා රු.7,263,837 ක් වටිනා GPS කැමරා 27 ක් වත්කම් ලේඛනයෙහි හා අවසන් ගිණුම්වල වාර්තා කර නොතිබුණු අතර එම උපකරණවල පැවැත්ම තහවුරු කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඝ) සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට මණ්ඩලය සතුව භෞතිකව පවතින මෝටර් වාහන හා යතුරු පැදි 351 කින් මෝටර් වාහන හා යතුරු පැදි 71 ක් පමණක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මෝටර් වාහන හා යතුරු පැදි 280 ක පිරිවැය අවසන් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි.

(ච) ඩිපෝවන් 07 ක් සහ ප්‍රාදේශීය කාර්යාල 02 ක් විසින් 2012, 2014, 2019, 2022, 2025 වර්ෂයන්හිදී තැන්පත් කරන ලද රු.2,826,987 ක් වටිනා නිෂ්කාශනය නොවූ චෙක්පත් නොගැළපීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද ලැබිය යුතු ශේෂ එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඡ) 2025 දෙසැම්බර් 31 දිනට මහරගම ඩිපෝවේ මහජන බැංකු ජංගම ගිණුමෙහි සංශෝධිත මුදල් ගිණුම අනුව රු.2,258,639 ක් වූ අයිරා ශේෂය රු.2,890,587 ක අයිරා ශේෂයක් ලෙස අවසන් ගිණුම්වල හඳුනාගෙන තිබූ බැවින් බැංකු අයිරා ශේෂය රු.631,948 ක් වැඩියෙන් ද හැටන්, වාරියපොල හා මහියංගනය යන ඩිපෝවන් වල එදිනට සංශෝධිත මුදල් ගිණුම අනුව රු.11,535,143 ක් වූ බැංකු අයිරා ශේෂය රු.9,350,391 ක් ලෙස ගිණුම්වල හඳුනාගෙන තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැංකු අයිරා ශේෂය රු.2,184,752 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ජ) ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ මහජන බැංකු ජංගම ගිණුමෙහි 2025 දෙසැම්බර් 31 දිනට සංශෝධිත මුදල් ගිණුම අනුව රු.15,200 ක ශේෂය රු.3,936,016 ක අයිරා ශේෂයක් ලෙස අවසන් ගිණුම්වලට ගෙන තිබීමෙන් මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.15,200 ක් අඩුවෙන් හා බැංකු අයිරා ශේෂය රු.3,936,016 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඣ) මඩකලපුව ඩිපෝව විසින් රු.38 ක හර ශේෂයක් සහ රු.602,180 ක අයිරා ශේෂයක් සහිත සාවද්‍ය ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් තුළ ජංගම ගිණුම් ශේෂ ලෙස නිරූපණය කර තිබූ බැවින් මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.38 කින් වැඩියෙන් ද බැංකු අයිරා ශේෂය රු.602,180 කින් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඤ) මහරගම ඩිපෝවේ මහජන බැංකු ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය 2025 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂ සනාථන අනුව රු.56,355,730 ක් වූවද අවසන් ගිණුම්වල ශේෂය රු.60,635,839 ක් ලෙස වාර්තා කිරීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.4,280,109 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඨ) නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය මගින් පරිපාලනය වන ඩිපෝවන් 05 ක් විසින් හා හඟුරන්කෙත ඩිපෝව විසින් 2021 සහ 2022 වර්ෂයන් වලදී රෝහල් 06 ක කාර්යය මණ්ඩලය ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.14,559,738 ක වටිනාකමක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එම හේතුවෙන් සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය මගින් පරිපාලනය වන ඩිපෝවන් 03 ක් විසින් රෝහල් කාර්ය මණ්ඩලය ප්‍රවාහනය වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.25,193,338 ක වටිනාකමක් සමාලෝචිත වර්ෂය තුළදී නිසි අනුමැතියකින් තොරව සමුච්චිත ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට මණ්ඩලය සතු රු.1,059,724,693 ක් වටිනා ස්ථාවර තැන්පතු 70 ක් වෙනුවෙන් ලැබිය යුතු පොලිය රු.16,870,030 ක් වුවද, ලැබිය යුතු පොලී ආදායම් ලෙස රු.10,072,659 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.6,797,371 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඪ) මහරගම ඩිපෝවේ ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම්ගත කර තිබූ රු.14,671,435 ක වටිනාකම 2025 වර්ෂය තුළදී මුදලින් ලැබී තිබුණද එය වැරදි සහගත ලෙස විශේෂ වාරිකා ආදායම් ගිණුමට බැර කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය සහ ලැබිය යුතු ආදායම් ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ණ) මහරගම ඩිපෝව විසින් ලාභය බෙදා ගැනීමේ පදනමින් ධාවනයට ලබාගත් බස් රථ සඳහා 2025 දෙසැම්බර් මාසයේදී ඉර 08 වාර්තා අනුව රු.654,274 ක් වටිනා ඉන්ධන ලීටර් 2,362 ක් භාවිතා කර තිබුණද බස් රථවල ලාභය ගණනයේදී ඉන්ධන පිරිවැය ලෙස රු.242,652 ක් වටිනා ඉන්ධන ලිටර් 876 ක් පමණක් හඳුනා ගැනීම හේතුවෙන් මණ්ඩලයට රු.349,879 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

(ත) සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.30,480,713 ක් වටිනා රඳවා ගැනීමේ බදු වටිනාකමක් වෙනත් ලැබිය යුතු ශේෂය යටතේ ගිණුම්ගත කර තිබුණි. මණ්ඩලයේ ආදායම් බදු වලින් නිදහස් වීම හේතුවෙන් මෙම වටිනාකම අදාළ වර්ෂයන්වල වියදමක් ලෙස හඳුනාගත යුතු වූවද එලෙස කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.15,228,438 කින් වැඩියෙන් ද සමුච්චිත අලාභය රු.15,252,275 කින් අඩුවෙන් ද වෙනත් ලැබිය යුතු ශේෂය රු.30,480,713 කින් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ථ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මාර්ගස්ථ තොග වටිනාකම් තුළ වසර 05 ත් 10 ත් අතර කල්පසු වූ රු.2,447,225 ක වටිනාකමක් තවදුරටත් මාර්ගස්ථ තොග ලෙස පැවති අතර, 2024 වර්ෂයේදී මාර්ගස්ථ තොග ලෙස පැවති රු.114,400 ක වටිනාකමකට අදාළ වත්කම් සමාලෝචිත වර්ෂයේදී වත්කම් ලෙස භාවිතා කරනු ලැබුව ද මාර්ගස්ථ තොග ශේෂයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ද) 2025 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොගය තුළ කුරුණෑගල දකුණ ඩිපෝව විසින් මණ්ඩලයේ අභ්‍යන්තර ආයතන වෙත ඉන්ධන නිකුත් කිරීම් වෙනුවෙන් ලැබිය යුතු රු.1,815,295 ක වටිනාකමක් ඇතුළත් කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ අවසන් තොගයේ වටිනාකම් සාවද්‍ය ලෙස රු.1,815,295 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ධ) අභ්‍යන්තර ගණුදෙනුවක් වන අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයේ බස් රථ සඳහා සපයනු ලබන ඉන්ධන වෙනුවෙන් වැල්ලවාය ඩිපෝවෙහි තැන්පත් කරන ලද රු.1,086,607 ක මුදල් ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට උපචිත වියදම් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(න) පුත්තලම ඩිපෝවෙහි 2001 වසරේ සිට 2024 වසර දක්වා රු.812,882 ක් වූ වරිපනම් බදු වටිනාකම් සහ උඩුදුම්බර ඩිපෝවෙහි 2022, 2023 හා 2024 වර්ෂ සඳහා විදුලිය සහ ජලය වෙනුවෙන් ගෙවිය යුතු රු.109,699 ක වටිනාකම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 කෙරෙහි අවධානය යොමු නොකෙට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන උපචිත තත්ත්වයට පත්කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා සමුච්චිත අලාභය රු.922,581 කින් අඩුවෙන් අවසන් ගිණුම් තුළ දක්වා තිබුණි.

(ප) ඩිපෝ 17 ක් වෙත සිසු සැරිය වෙනුවෙන් රු.35,616,805 ක් හා නිසි සැරිය වෙනුවෙන් රු.27,773,123 ක් ලෙස එකතු වටිනාකම් රු.63,389,928 ක් සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතුව තිබුණ ද මෙම වටිනාකම් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා ලැබිය යුතු ආදායම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඵ) සමාලෝචිත වර්ෂයේ කැස්බෑව ඩිපෝවෙහි විදුලි වියදම් තුළ 2024 වර්ෂයේ විදුලිය වෙනුවෙන් ගෙවූ රු.2,445,676 ක් ද, බදු ගැණුම්කරුවන්ගෙන් අයකර ගනු ලබන පිළියන්දල බස් නැවතුම්පලේ කඩ කාමරවල විදුලි වියදම් රු.1,398,994 ක් ද ඇතුළත්ව තිබූ බැවින්,

සමාලෝචිත වර්ෂයේ විදුලි වියදම රු.3,844,670 කින් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(බ) සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද දේපළ, පිරියත හා උපකරණ ශේෂය සහ ස්ථාවර වත්කම් ලේඛණයෙහි සඳහන් ශේෂය අතර වත්කම් අයිතම 08 ක පිරිවැයෙහි රු.2,688,230,077 ක ද, වත්කම් අයිතම 07 ක සමුච්චිත ක්ෂය වටිනාකමෙහි රු.2,115,347,228 ක ද වෙනසක් පැවතුණි. එමෙන්ම 2025 දෙසැම්බර් 31 දිනට සකසා තිබූ දේපළ, පිරියත හා උපකරණ ලේඛණය තුළ ඇතුළත් රු.133,393,416 ක පිරිවැයක් සහිත මෝටර් වාහන 60 ක ලියාපදිංචි අංකය හඳුනාගැනීමට නොහැකි වීම මත පැවැත්ම සම්බන්ධයෙන් තහවුරුවක් ලබා ගැනීමට විගණනයට නොහැකි විය.

(භ) 2025 දෙසැම්බර් 31 දිනට පැවති රු.10,476,954 ක් වූ නොගෙවූ වේතන ශේෂය තුළ වසර 01 සිට වසර 10 ට වඩා වැඩි කාල පරාසයක සිට පැවත එන ශේෂයක් පැවතිය ද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ආදායමට හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ම) කොවිඩ් කාලවකවානුව තුළ රෝහල් කාර්යය මණ්ඩලය ප්‍රවාහනය වෙනුවෙන් බණ්ඩාරවෙල ඩිපෝවට ලැබිය යුතුව තිබූ රු.994,132 ක ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී විශේෂ වාරිකා ගිණුමට වැරදි සහගත ලෙස හර කර ලැබිය යුතු ගිණුම් වලින් ඉවත් කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු වෙනත් ආදායම් ශේෂය හා වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ය) සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.1,035,319,139 ක් වටිනා දේශීය මිලදී ගැනුම් අත්තිකාරම් ශේෂය වසර 10 කට වැඩි කාලයක් පැවතියද එය පියවීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා අවශ්‍ය මූලාශ්‍ර ලේඛණ හෝ උපලේඛණ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වලට සිදු වූ බලපෑම විගණනයට තහවුරු කරගත නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2025 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි මණ්ඩලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ)

වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අදාළ වන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ අ,ඉ,ඊ,උ,ඌ,එ,ඔ,ඕ,ක,ඛ,ච,ඣ,ඪ,හ,ය දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලය යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ) 1833 කර්මාන්ත ශාලා ආඥා පනතේ හා 2000 අංක 33 දරන සංශෝධිත කර්මාන්ත ශාලා පනතේ 42 (අ) (1) වගන්තිය සහ 53(1) වගන්තිය	පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව සෑම කර්මාන්ත ශාලාවකම ගිනි නිවන උපකරණ ඊට අදාළ නියෝගවලට අනුකූලව සපයා ස්ථාපිත කර තිබිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ගිනි නිවන උපකරණ 2,055 ක අවශ්‍යතාවයක් පැවතුණද එම උපකරණ සවිකර නොතිබුණි. එමෙන්ම කර්මාන්ත ශාලා සේවකයන්ගේ

		සෞඛ්‍ය ආරක්ෂාව හා ඇස් සඳහා ආරක්ෂිත උපකරණ සලසා නොතිබුණි.
(ආ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 සහ 16 වන වගන්ති හා 1982 අංක 03 දරන පනතින් සංශෝධිත හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 16 සහ 27 වන වගන්ති	මණ්ඩලය විසින් සේවක අර්ථසාධක දායක මුදල් හා සේවා නියුක්තිකයන් භාරකාර අරමුදල් පනත් ප්‍රකාරව නියමිත දින ඉක්මවා ප්‍රමාදයන් මත ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු.231,315 ක් හා රු.242,618 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි.
(ඇ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 05 (1) සහ 05 (4) වගන්තිය	පනතේ විධිවිධාන ප්‍රකාරව සේවය අවසන් වූ සේවකයන් හට නියමිත දිනට පාරිතෝෂික ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 02 ක්, ඩිපෝවන් 05 ක් සහ එක් ප්‍රාදේශීය වැඩපලක් විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,536,485 ක මුදලක් පාරිතෝෂික අධිභාර වශයෙන් ගෙවා තිබුණි.
(ඈ)	2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 07 (ඉ) වගන්තිය	සේවකයාගේ දළ වැටුප රු.25,000 ඉක්මවන අවස්ථාවේදී අයකරනු ලබන රු.25 ක මුද්දර ගාස්තුව කාර්තුවක් අවසන් වී දින පහළොවක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් 2025 දෙසැම්බර් 31 දිනට අයකර ගනු ලැබූ මුද්දර ගාස්තු වටිනාකම වූ රු.32,956,731 ක් වසරකට වඩා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. මෙම ශේෂය තුළ වසර 10 කට වැඩි කාලයක් ඉක්මවූ රු.3,656,737 ක ශේෂයක් ද ඇතුළත්ව තිබුණි.
(ඉ)	2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත	ගමනාගමන මණ්ඩලයට අයත් සියළුම ඩිපෝ පරිශ්‍රයන්හි සහ ප්‍රාදේශීය වැඩපලවල ඇති අංගනවල ඉන්ධන හා ලිහිසි තෙල් අපද්‍රව්‍ය සහ ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය බැහැරකිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක්

		ස්ථාපිත කර ඒ සඳහා පාරිසරික බලපත්‍රයක් ලබාගත යුතු වුවත් මණ්ඩලයට අයත් ඩිපෝවන් 109 න් ඩිපෝවන් 52 ක් සහ ප්‍රාදේශීය වැඩපල 13 න් ප්‍රාදේශීය වැඩපල 08 ක් සමාලෝචිත වර්ෂය තුළදී මෙම පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඊ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 (1) සහ (2) වගන්ති	විගණකාධිපතිවරයාගේ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ලැබීමෙන් පසු ඒ වාර්තාව සලකා බලා යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම, ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව විගණකාධිපතිවරයාට මාස 03 ක් ඇතුළත දැනුම් දියයුතු වුවත්, 2024 වර්ෂයේ අවසන් ගිණුම් විගණනය වෙනුවෙන් නිකුත් කරන ලද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කර මාස 10 කාලයක් ගත වී තිබුණ ද පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට මණ්ඩලයේ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.
(උ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 396 (ඇ) (i) හා (iii)	2025 දෙසැම්බර් 31 දින වන විට ඩිපෝවන් 13 ක් ප්‍රාදේශීය කාර්යාල 03 ක් හා එක් ප්‍රාදේශීය වැඩපලක් විසින් ගෙවීම් සඳහා නිකුත් කරන ලද වලංගු කාලය මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.8,213,155 ක් වූ චෙක්පත් 35 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 571	ඉකුත් වූ සියළුම තැන්පතු ආදායමට බැර කළ යුතු වුවද අදාළ පාර්ශව වෙත මුදා හැරීමකින් හෝ ආදායමට බැර කිරීමකින් තොරව රු.11,534,660 ක ටෙන්ඩර් තැන්පතු වර්ෂ 02 කට වැඩි කාල සීමාවක් තිස්සේ වගකීම් යටතේ

දක්වා තිබුණි.

(ඌ)	භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5. (ඇ) සහ 1.5.4 (ආ) වගන්තිය	ලංසුකරුවන් විසින් බැඳියාවන් පිළිබඳ සවිටනයන් නොමැති බවත්, එක් ලංසුවක් පමණක් ඉදිරිපත් කරන බවත් හා දුස්සන්ධානීය ක්‍රියාවන්ට සම්බන්ධ නොමැති බවටත් අනිවාර්ය ප්‍රකාශයක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතු අතර රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන් සහභාගිවන ඕනෑම රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවක් සම්බන්ධයෙන් තමන්ගේ බැඳියාවන් පිළිබඳ සවියනයන් නොමැති බවට ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු වුවද මණ්ඩලය විසින් 2025 වර්ෂයට අදාළව සිදු කරන ලද ප්‍රසම්පාදන කටයුතු 39 ක් සඳහා එම ප්‍රකාශ ලබාගෙන නොතිබුණි.
(එ)	භාණ්ඩ,වැඩ හා උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන අත්පොත - 2024	
(i)	3.1.2 (ආ) වගන්තිය	ලංසු කැඳවීම පුළුල් ලෙස බෙදා හරින ජාතික පුවත්පත්වල රාජ්‍ය භාෂාවන්ගෙන් ලුහුඬු දැන්වීමක් ලෙස පමණක් ප්‍රචාරය කළ යුතු අතර, වැඩිදුර විස්තර උචිත පරිදි ප්‍රසම්පාදන අස්තිත්වයේ වෙබ් අඩවිවල පල කළ යුතු වුවද මණ්ඩලය විසින් ප්‍රසම්පාදන දැන්වීම් ජාතික පුවත්පත්වල භාෂා ත්‍රිත්වයෙන් 25cm x 16 cm ප්‍රමාණයෙන් පළකිරීම සඳහා රු.3,137,467 ක වියදමක් සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබුණි.
(ii)	4.1.5 වගන්තිය	පූර්ව සුදුසකම් සහිතව සහ රහිතව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කරමින් ප්‍රසම්පාදන කටයුතු ඉටු කර අවසන් කිරීම සඳහා රු.මිලියන 50 ත් රු.මිලියන 750 ත් අතර වටිනාකම් සහිත ප්‍රසම්පාදන කාර්යයන් සඳහා උපරිම ලංසු කාලය පිළිවෙලින් සති 08 ක් සහ සති 06 ක් වුවද නියැදි පරීක්ෂාවට ලක්කළ 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන කටයුතු 11 ක

		ප්‍රසම්පාදන කටයුතු ඉටුකර අවසන් කළ යුතු කාල සීමාව ඉක්මවා සති 18 ක සිට සති 56 දක්වා අතිරේක කාලයක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව ලබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.
(ඒ)	අංක පීඊඩී 01/2021 දරන 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය	සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, නියමිත දිනය ඉක්මවා දින 79 ක ප්‍රමාදයකින් පසු 2026 මැයි 18 දින මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.
(ඔ)	2024 ඔක්තෝබර් 14 දිනැති හා ශ්‍රීලංගම/නිසාධා/ධාකො/වක්‍රලිපි /2024-05 අංක දරන ධාවන කොට්ඨාශ අභ්‍යන්තර වක්‍රලේඛය	වක්‍රලේඛ විධිවිධාන වලට අනුව සුඛෝපභෝගී හා අධිසුඛෝපභෝගී බස් රථ අධිවේගී මාර්ගයන්හි කොන්දොස්තර සහිතව ධාවනය කිරීමේදී මාර්ග ලේඛන ආදායමින් රියදුරු හා කොන්දොස්තර යන දෙදෙනාටම සියයට 0.77 බැගින් ද, කොන්දොස්තර රහිතව ධාවනය කිරීමේදී මුළු ආදායමින් රියදුරුට සියයට 1.4 ක් හා කොන්දොස්තර සඳහා සියයට 0.6 ක් වශයෙන් සියයට 2 ක් ප්‍රසාද මුදල් ගෙවිය යුතු වුවද 2025 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් යන මාස වලදී මහරගම ඩිපෝව මගින් ධාවනය කරවන ලද අධිසුඛෝපභෝගී බස් රථවල මාර්ග ලේඛන ආදායමෙන් සියයට 2.5 ක් ප්‍රසාද දීමනාව ලෙස ගෙවා තිබූ බැවින් වක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව රු.449,219 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.
(ඕ)	2011 මාර්තු 04 දිනැති හා 2011 අංක 05 දරන ධාවන කොට්ඨාශ වක්‍ර ලිපිය	මාර්ග ලේඛන හිඟ මුදල් සම්පූර්ණයෙන්ම අදාළ මුදලට සමාන අධිභාරයක් සමඟ ඊළඟ මාසයේ වේතනයෙන් අය කළ යුතු වූවද සමාලෝචිත වර්ෂය අවසන් දිනට සකස් කරන ලද අවසන් ගිණුම් තුළ රු.7,188,637 ක මාර්ග ලේඛන හිඟ මුදල් ශේෂයක් පැවතුණි. ඒ අනුව මෙම වක්‍ර ලිපිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට මණ්ඩලය

කටයුතු කිරීම සඳහා ගණකාධිකාරී කාර්යාලය මගින් ප්‍රමාදයකින් තොරව මාර්ග ලේඛන පරීක්ෂා කිරීම සිදු කිරීම අනිවාර්යය බව සඳහන්ව තිබුණ ද නිසි කාල සීමාවන් තුළදී මෙම කටයුතු සිදු නොවීම මත මාර්ග ලේඛන හිඟ මුදල් අයකර ගැනීමට නොහැකි වීමට හේතු වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ගමනාගමන මණ්ඩලයේ රථ ඇණිය සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම සහ පෙරසවි කිරීම සඳහා 2017 වර්ෂයෙන් පසුව ප්‍රසම්පාදනයක් සිදුකිරීමකින් තොරව 2017 වර්ෂයේ තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් අඛණ්ඩව මිලදී ගෙන තිබූ අතර, මිල උච්චාවචනය පාදක කරගෙන වරින් වර මිල ගණන්ද සංශෝධනය කර තිබුණි. මෙලෙස වසර 08 කට අධික කාලයක් 2017 වර්ෂයේදී තෝරාගන්නා ලද සැපයුම්කරුවන්ගෙන් ටයර් පෙරසවි හා නැවත පිරවීමේ කටයුතු සිදු කර ගන්නා බැවින්, තරඟකාරී මිල ගණන් යටතේ එම කටයුතු සිදු කර ගැනීමට තිබූ අවස්ථාව මණ්ඩලයට ඇහිරී ගොස් තිබූ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන අත්පොතෙහි 5.19 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වීමට ප්‍රථම කොන්ත්‍රාත්කරුගෙන් කාර්යසාධන ලංසු සුරක්ෂණය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.5,837,460 ක් වූ මුදල් ගණනය කිරීමේ යන්ත්‍ර 25 ක් ලැබී දින 40 කින් පසුව රු.584,000 ක් වටිනා කාර්යසාධන බැඳුම්කරය ඉදිරිපත් කර තිබුණි. ටෙන්ඩරය පිරිනැමීමද 2025 ජූලි 31 වන දින එනම් ඇණවුම ගබඩාවට වෙත ලැබී දින 34 කට පසුව සිදුකර තිබුණි. ඒ අනුව මෙම ප්‍රසම්පාදනය නිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කර නොතිබුණි.

(ඇ) මහරගම ඩිපෝව විසින් රු.41,300 ක් වටිනා අමතර කොටස් මිලදී ගැනීම සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී පෞද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත් කර තිබූ මිල ඉල්ලුම්පත් 03 න් ඉල්ලුම් පත් 02 ක් ව්‍යාජ ආයතනික නිල මුද්‍රා සහ ව්‍යාජ අත්සන් යොදා ඉදිරිපත් කරන ලද ඒවා බව 2026 මාර්තු 13 වන දින ගබඩා පාලක විසින් විගණනයට ලබා දෙන ලද ප්‍රකාශය අනුව නිරීක්ෂණය විය. මේ අනුව මෙම ප්‍රසම්පාදනයට අදාළව ප්‍රසම්පාදන මූලධර්ම උල්ලංඝනය කරමින් ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම සිදු වී තිබූ බැවින් තරඟකාරී මිල ගණන් යටතේ භාණ්ඩ මිලදී ගැනීමට තිබූ අවස්ථාව හිතාමතාම අවහිර කිරීම තුළින් මණ්ඩලයට මූල්‍යමය පාඩුවක් සිදුකර තිබුණි.

(ඈ) අධිසුඛෝපභෝගී බස් රථ සඳහා අවශ්‍ය ටයර් ප්‍රසම්පාදනය කිරීමේ කාලසටහනට අනුව තෝරාගනු ලබන සාරානුකූල ලංසුකරු සමග ගිවිසුම්ගතවීම 2024 මැයි 17 වන දින සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද වසරක කාල ප්‍රමාදයකින් පසුව 2025 මැයි 09 වන දින ගිවිසුම්ගත වී තිබුණි. ඒ අනුව නියමිත කාලවකවානුව තුළදී ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම හේතුවෙන් 2025 මැයි මාසයේදී අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයේ බස් රථ 04 ක් ටයර් නොමැති වීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබූ අතර, බස් රථ 15 ක් ධාවනයට නුසුදුසු ටයර් සහිතව අධිවේගී මාර්ගයන්හි ධාවනයට යොමු කර තිබුණි.

(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තෝරාගත් සාරානුකූල ලංසුකරු කවුරුන්ද යන්න ලංසු ඉදිරිපත් කළ අනෙකුත් ලංසුකරුවන් වෙත දැනුම්දුන් පසු එකී ප්‍රසම්පාදන කමිටු තීරණයට සෙසු ලංසුකරුවන් එකඟ නොවන්නේ නම් පිහිටුවන ලද ප්‍රසම්පාදන අභියාචනා කමිටුව වෙත මේ පිළිබඳ අභියාචනා ඉදිරිපත් කළ හැකි වූවද 2025 වසරේ ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන කාර්යයන් 35 ක් සඳහා අභියාචනා කමිටු පත්කර වගකීම් පවරා නොතිබුණි.

(ඊ) 2025 වර්ෂය වෙනුවෙන් මිලදී ගැනීමට සැලසුම් කරන ලද නියැදි පරීක්ෂාවට ලක් කළ රු.මිලියන 2,436 ක් වටිනා බස් රථ අමතර කොටස් වෙනුවෙන් වූ ප්‍රසම්පාදන කටයුතු 14 ක් මාස 03 සිට මාස 18 ක් වැනි දීර්ඝ කාලයක් ප්‍රමාද වී තිබීම හේතුවෙන් රථ ඇණිය ප්‍රශස්ථ මට්ටමෙන් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

3. වෙනත් කරුණු

(අ) 2025 මාර්තු 25 දිනැති අංක 4/2/1/9/(63)06 සිට 11 දක්වා දොම්පේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කර තිබූ ඉඩම් පැවරීමේ සහතික 06 ක් මගින් කිරිඳිවැල බස් නැවතුම්පල භූමියේ හිමිකාරිත්වය කිරිඳිවැල ඩිපෝවට පවරා තිබුණි. මෙම පරිශ්‍රයේ පිහිටි කඩ කාමර 28 ක් සඳහා 2025 වර්ෂය තුළදී විදුලි පහසුකම් ලබා ගැනීම සඳහා රු.5,585,723 ක් ද, ජල පහසුකම් ලබා ගැනීම සඳහා රු.1,228,423 ක් ද ගෙවා තිබුණ ද මෙම කඩ කාමර 28 ටෙන්ඩර් කැඳවා බදු වශයෙන් ලබා දීමට 2025 පෙබරවාරි 18 දින පැවති 03 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබියදී ද 2026 මාර්තු මස වන විටත් ජල සහ විදුලි පහසුකම් කඩ කාමර වෙත වෙන් වෙන්ව සපයා විධිමත් පරිදි බදු ලබාදී ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පානදුර බස් නැවතුම්පලේ පිහිටි මුළු වර්ග අඩි 2,758 ක් වූ කඩ කාමර 15 ක් එකතු වටිනාකම රු.140,000 ක් වූ මාසික බදු කුලියකට විධිමත් තක්සේරු වාර්තාවකින් තොරව කුලී ගැණුම්කරුවන් 11 දෙනෙකුට බදු පදනමින් ලබා දී තිබූ අතර, එක් වර්ග අඩියක සාමාන්‍ය කුලී වටිනාකම රු.51 ක් විය. එම කුලී වටිනාකම් 2022 වර්ෂයේ සිට මේ දක්වා කිසිදු අවස්ථාවක සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2025 දෙසැම්බර් 31 දින වන විට කඩ කුලිය රු.1,235,500 ක මුදලක් හිඟව තිබුණි. මෙය මාස 01 සිට මාස 27 දක්වා කාල පරාසයක හිඟ හිටිව පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) මධ්‍යම බස් රථ කාර්යාල භූමියෙහි පිහිටි වෙළඳසැල් 59 ක්, ජංගම කරත්ත 15 ක් සහ පොදු වැසිකිලි පද්ධතියක් මාසික සහ දෛනික කුලී පදනමට ලබා දී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට කඩකුලී ආදායම, විදුලි ගාස්තුව සහ ජල ගාස්තුව ලෙස රු.39,724,086 ක මුදලක් ලැබිය යුතුව තිබුණ ද Clean Sri Lanka වැඩසටහන යටතේ මෙම පරිශ්‍රය ප්‍රතිසංස්කරණය සඳහා 2025 සැප්තැම්බර් සිට සියලුම කුලී ගැණුම්කරුවන් පරිශ්‍රයෙන් ඉවත් කිරීම හේතුවෙන් මෙම මුදල අයකර ගැනීමට නොහැකි වීමේ අවධානමක් පැවතුණි.

(ඈ) පිලියන්දල බස් රථ නැවතුම්පලෙහි පිහිටි කඩ කාමර 10 ක් බදු පදනමින් බාහිර පාර්ශවයන් 10 ක් වෙත කුලී පදනමින් ලබා දීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දින වන විට කුලී මුදල ලෙස රු. 690,000 ක් ද, විදුලි ගාස්තුව ලෙස රු.427,660 ක්ද, ජල ගාස්තුව ලෙස රු.900,209 ක්ද, වශයෙන් රු.2,017,869 ක මුදලක් ලැබිය යුතුව තිබුණද එම ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම 2022 දෙසැම්බර් 31 දින සිට සමාලෝචිත වර්ෂය අවසන් දිනය දක්වා බදු ගැණුම්කාර පාර්ශව සමඟ බදු කුලී ගිවිසුම් ඇතිකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඉ) 2025 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතු බස් රථ ඇණිය 7,130 ක් වූවද එදිනට ධාවන තත්ත්වයේ පැවතියේ බස් රථ 5,104 ක් පමණක් හෙවත් මුළු රථ ඇණියෙන් සියයට 72 ක ප්‍රතිශතයකි. බස් රථ 2,026 ක් හෙවත් මුළු බස් රථ ඇණියෙන් සියයට 28 ක් විවිධ වූ හේතු මත ධාවනයෙන් ඉවත්ව ඌණ උපයෝජිතව පැවති අතර, මණ්ඩලය සතු කාලසටහන් ප්‍රමාණය ආවරණය කිරීම සඳහා බස් රථ 7,205 ක අවශ්‍යතාවයක් පැවතියද බස් රථ 2,101 ක ඌණතාවයක් පවතින බැවින් මණ්ඩලය විසින් ආවරණය කරනුයේ තම කාලසටහන් අවශ්‍යතාවයෙන් සියයට 71 ක ප්‍රතිශතයක් පමණක් වන අතර, මණ්ඩලයේ රථ ඇණිය ශක්තිමත් කිරීමේ කඩිනම් අවශ්‍යතාවයක් සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට පැවතුණි.

(ඊ) 2025 දෙසැම්බර් 31 දින ධාවනයට ලබා දී තිබූ බස් රථ 5,104 න් බස් රථ 1,954 ක් හෙවත් සියයට 38 ක් ජීව කාලය අවුරුදු 15 කට වැඩි බස් රථ වූ අතර අවුරුදු 02 කට වඩා අඩු කාලයක් තුළදී රථ ඇණියට නව බස් රථ එක් කර නොතිබුණි. මෙලෙස ජීවකාලය වැඩි බස් රථ වැඩි වශයෙන් ධාවනයට එක් කිරීමට සිදුවීම හේතුවෙන් නිරන්තරයෙන් අළුත්වැඩියාවන් කිරීමට සිදු වී තිබූ අතර, 2021 වසරේ සිට 2023 වසර දක්වා බස් රථ අළුත්වැඩියා වියදම ක්‍රමිකව සියයට 16 සිට 95 දක්වා ක්‍රමිකව ප්‍රතිශතාත්මකව වැඩි වී තිබූ අතර, 2024 වර්ෂයේ සියයට 58 ක් දක්වා ප්‍රතිශතාත්මකව අඩු වී තිබුණි.

(උ) 2014 වර්ෂයේදී මණ්ඩලයට ප්‍රදානයක් ලෙස ලද වර්තමානයේදී කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයට අනියුක්තව ඇති Youtong වර්ගයේ B මාදිලියට අයත් බස් රථ 88න් බස් රථ 40 ක් 2025 දෙසැම්බර් 31 දින වන විට දීර්ඝ කාලීනව ධාවනයෙන් ඉවත්ව තිබූ අතර, එය රථ ඇණියෙන් සියයට 45 ක ප්‍රතිශතයකි. අධිවේගී මාර්ගයන්හි ධාවනයට යොදවනු ලබන මෙම බස් රථ හැකි ඉක්මණින් ධාවනයට එක්කර දෛනික ලාභයෙන් සියයට 85 ක් පෞද්ගලික ආයතනයකට ගෙවීමේ පදනමින් ලබාගෙන තිබූ බස් රථ ධාවනයෙන් ඉවත් කිරීමට මණ්ඩලයේ කළමනාකරණයෙහි නිසි අවධානය යොමු වී නොතිබුණි.

(ඌ) මණ්ඩලය සතු අධිසුඛෝපභෝගී බස් රථ 142 න් බස් රථ 52 ක් හෙවත් සියයට 37 ක ප්‍රමාණයක් 2025 දෙසැම්බර් 31 දින වන විට අළුත්වැඩියා කටයුතු සඳහා දින 76 සිට දින 2,335 ක් දක්වා කාල පරාසයකින් යුතුව මුළු දින 31,492 ක කාලයක් දීර්ඝකාලීනව ධාවනයෙන් ඉවත් කර තිබුණි.

(එ) රථ ඇණිය ප්‍රමාණවත් හා ශක්තිමත් නොවීම හේතුවෙන් කොළඹ, ගම්පහ සහ කළුතර ප්‍රාදේශීය කාර්යාලයන්ට අයත් ඩිපෝවන් 25 ක් විසින් දුර ගමන් සේවා පිළිවලින් 32 ක්, 58 ක්, සහ 10 ක් මෙන්ම කෙටි ගමන් සේවා පිළිවලින් 201 ක්, 250 ක් සහ 114 ක් දීර්ඝ කාලීනව ධාවනය කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් සහිත කිලෝමීටර් 40,996,435 ක් අහිමි වී තිබූ අතර 2025 වර්ෂයේ ධාවන කිලෝමීටරයකට සාමාන්‍ය ආදායම වූ රු.144 ට අනුව ගණනය කිරීමේදී මෙම දුර ගමන් සේවා සහ කෙටි ගමන් සේවා ධාවනය නොකිරීම තුළ සමාලෝචිත වර්ෂය තුළදී රු.5,903,486,640 ක ඇස්තමේන්තුගත ආදායමක් මණ්ඩලයට අහිමි වී තිබුණි.

(ඒ) NB 5516 අංක දරන අධිසුඛෝපභෝගී බස් රථය 2023 වර්ෂයේදී කැස්බෑව ඩිපෝව වෙත ලැබී සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට වසර 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද සහ එම කාලය තුළදී රු.6,523,259 ක වියදමක් දරමින් අළුත්වැඩියා කටයුතු සිදු කලද බස් රථය ධාවනයට එක් කිරීමට ඩිපෝ කළමනාකරණය අපොහොසත් වී තිබුණි. ඩිපෝව සතු අධිවේගී මාර්ග කාලසටහන් ආවරණය සඳහා ලාභය බෙදා ගැනීමේ පදනමින් අශෝක් ලේලන්ඩ් සමාගමේ බස් රථයක් ලබාගෙන ධාවනයට එක් කර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.12,942,571 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව ඩිපෝව සතු අධිසුඛෝපභෝගී බස් රථ කඩිනමින් අළුත්වැඩියා කර ධාවනයට එක් නොකිරීමෙන් ආදායමක් බාහිර ආයතනයක් වෙත ගෙවීමට සිදුව තිබුණි.

(ඔ) A මාදිලියට අයත් දෙමහල් බස් රථ 17 ක් 2025 දෙසැම්බර් 31 දිනය වන විට මණ්ඩලය සතු වූවද ඉන් ධාවන තත්ත්වයේ පවතිනුයේ බස් රථ 06 ක් පමණි. එබැවින් බස් රථ 11 ක් හෙවත් සියයට 65 ක ප්‍රමාණයක් ධාවන තත්ත්වයේ නොතිබුණු අතර මෙම බස් රථ ධාවන තත්ත්වයට පත්කර විශේෂ චාරිකා සඳහා යෙදවීමට කටයුතු කිරීමෙන් ඉහළ ආදායමක් ඉපයීමට හැකියාව තිබුණ ද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඕ) 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.මිලියන 1,527 ක නව එන්ජින් කට්ටල 235 ක් මිලදී ගැනීම සඳහා වෙන්කර තිබුණ ද 2025 දෙසැම්බර් 31 දින වන විට මිලදී ගෙන තිබුණේ එන්ජින් කට්ටල 97 ක් හෙවත් මූලික අවශ්‍යතාවයෙන් සියයට 41 ක් පමණි. මේ හේතුව නිසා එන්ජින් කට්ටල නොමැතිව ධාවනයට එක් කළ නොහැකි බස් රථ ප්‍රමාණය සමලෝචිත වර්ෂය අවසන් දිනට 418 ක් දක්වා ඉහළ ගොස් තිබූ බැවින් දෛනික කාලසටහන් අවශ්‍යතාවය සපුරා ගත නොහැකි වී මණ්ඩලයේ ආදායමට අහිතකර ලෙස බලපා තිබුණි.

(ක) 2025 දෙසැම්බර් 31 දිනට දීර්ඝකාලීනව ධාවනයෙන් ඉවත්ව තිබූ අධිසුඛෝපභෝගී බස් රථ 35 ක් ධාවනයට එක් නොකිරීම මත දෛනිකව ආදායම් සහිත ධාවන කිලෝමීටර් 19,349 ක් අහිමි වී

තිබූ බැවින් අධිවේගී මාර්ගයේ ධාවන කිලෝමීටරයකට සාමාන්‍ය ආදායම වූ රු.250 ට අනුව ගණනය කිරීමේදී දිනකට රු.4,837,250 ක ඇස්තමේන්තුගත මාර්ගලේඛන ආදායමක් ද සමාලෝචිත වර්ෂය තුළදී රු.1,765,596,250 ක ඇස්තමේන්තුගත මාර්ගලේඛන ආදායමක් ද මණ්ඩලයට අහිමි වී තිබුණි. ඒ තුළ වූ බස් රථ 19 ක් 2025 වර්ෂය පුරාවටම ධාවනයෙන් ඉවත්ව තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයට රු.911,587,500 ක ඇස්තමේන්තුගත මාර්ග ලේඛන ආදායමක් අහිමි වී තිබුණි.

(ඛ) 2024 මාර්තු 27 දිනැති 03 වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ඒ වන විට ක්‍රියාත්මකව තිබූ ලාභය බෙදා ගැනීමේ පදනම මත බාහිර පාර්ශවයන්ගෙන් ලබාගෙන මණ්ඩලය මගින් ධාවනය කරවන අධිසුඛෝපභෝගී බස් රථ සඳහා අවම ශ්‍රී ලංගම ලාභ ප්‍රතිශතය 2024 අප්‍රේල් 01 දින සිට සියයට 20 ක් දක්වා වැඩි කිරීමටත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් පසුව අධිසුඛෝපභෝගී බස් රථ ලබා ගන්නා බාහිර පාර්ශවයන් සමඟ 2024 දෙසැම්බර් 31 දක්වා ගිවිසුම්ගත වීමටත් තීරණය කර තිබුණ ද 2025 දෙසැම්බර් 31 දින වන විට එම තීරණය ක්‍රියාත්මක කළ යුතු දිනය ඉක්මවා මාස 21 ක් ගතවී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට කිසිදු උත්සාහයක් මණ්ඩලයේ කළමනාකරණය විසින් ගෙන නොතිබුණු අතර 2025 වර්ෂය වෙනුවෙන් බාහිර සමාගමකින් ලබාගත් බස් රථ 83 සඳහා එම සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමක් ඇති කර ගෙන නොමැති පසුබිමක 2025 වර්ෂය තුළදී මෙම බස් රථ වෙනුවෙන් රු.2,217,201,821 ක මුදලක් ගෙවා තිබුණි.

(ග) කොළඹ, සබරගමුව සහ රුහුණ ප්‍රාදේශිකයන්ට අයත් ඩිපෝවන් සතු අධිසුඛෝපභෝගී බස් රථ 14 ක් අළුත්වැඩියා කටයුතු සඳහා ධාවනයෙන් ඉවත්ව තිබූ අතර එම බස් රථ 14 හි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් මුළු ඇස්තමේන්තුගත වටිනාකම රු.23,391,110 කි. මෙම අළුත්වැඩියාවන් කඩිනමින් සිදු නොකිරීම මත එම බස් රථ ධාවනය නොකිරීමෙන් මණ්ඩලයට දෛනිකව අහිමිවන ආදායම් සහිත ධාවන කිලෝමීටර් ප්‍රමාණය 8,370 ක් වන බැවින් දෛනිකව ඉපයිය හැකිව තිබූ රු.2,092,500 ක ආදායමක් අහිමි වන බවත්, එම බස් රථ කඩිනමින් අළුත්වැඩියා කර ධාවනයට යෙදවූවේ නම් දින 11 ක් තුළදී ඇස්තමේන්තුගත මුළු අළුත්වැඩියා වියදම ආවරණය කරගත හැකිව තිබුණ ද ඒ වෙනුවෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඝ) ඩිපෝවන් 25 ක් සහ එක් ප්‍රාදේශීය කාර්යාලයක් විසින් 2025 දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රු.9,846,942 ක් වූ වරිපනම් බදු අදාළ පළාත් පාලන ආයතන වෙත ගෙවීම් කර නොතිබුණි. මේ හේතුවෙන් දඩ මුදල් ගෙවීමට සිදුවීමේ හා අදාළ දේපළ පළාත් පාලන ආයතන විසින් පවරා ගැනීමට ලක් වීමේ අවධානමක් පවතින අතර නිසි කාල සීමාවන් තුළදී ගෙවීම් සිදු කිරීමේදී ලබා ගත හැකිව තිබූ වට්ටම් ද අහිමි වී තිබුණි. ඒ අනුව ඩිපෝවන් 22 ක් සහ එක්

ප්‍රාදේශීය කාර්යාලයක් විසින් 2025 තක්සේරු වර්ෂයට අදාළ වරිපනම් බදු මුදල වන රු.3,885,736 ක මුදල එම වර්ෂය තුළදී ගෙවීමට කටයුතු කර නොමැති බැවින්, නිසි කාල සීමාවන් තුළදී ගෙවීම් කරනු ලැබුවේ නම් ලබාගත හැකිව තිබූ රු.388,573 ක මුදල් වට්ටම මණ්ඩලයට අහිමි වී තිබුණි.

(ව) 2025 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10 ක් ඉක්ම වූ ඉතිරි කිරීමේ ගිණුම් 20 ක රු.917,210,579 ක මුදලක් හා ජංගම ගිණුම් 03 ක රු.85,196,620 ක මුදලක් පැවති අතර, දෛනික කටයුතු සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් පමණක් රඳවා ගෙන ඉතිරි මුදල් ස්ථාවර තැන්පත් හෝ වෙනත් වැඩි ප්‍රතිලාභයක් සහිත අයෝජන මාර්ගවල අයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබීම නිසා මණ්ඩලයට ඉපයිය හැකිව තිබූ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ශ) ගමනාගමන මණ්ඩලයේ සභාපතිගේ උපදෙස් ප්‍රකාරව සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම වෙත ආරක්ෂක සේවා සැපයීමට සහ ඊට අදාළ ගෙවීම් ලබා ගැනීම සඳහා ගිවිසුමකට එළඹීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) වෙත පවරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආරක්ෂක සේවාවන් සපයා මාස 22 ක් ගත වී ඇතත් සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණු අතර, එම කාලය වෙනුවෙන් රු.17,640,299 ක මුදලක් මණ්ඩලයට ලැබිය යුතුව තිබුණද එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ෂ) කොවිඩ් කාල වකවානුව තුළදී රෝහල් කාර්යය මණ්ඩලය ප්‍රවාහනය සඳහා විධිමත් ගිවිසුම්ගත වීමකින් තොරව මණ්ඩලයේ බස් රථ යෙදවීම වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.154,931,306 ක මුදලක් වසර 05 ක් ගත වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඛ) රථ ඇණිය ධාවනයට අවශ්‍ය ටයර් නැවත පිරවීම සහ පෙරසවි කිරීම අසාර්ථක වීම වෙනුවෙන් ඩිපෝවන් 07 ක් විසින් ප්‍රතිදාන අයකර ගැනීම සම්බන්ධව 2023, 2024 සහ 2025 යන වර්ෂයන් වලදී නිකුත් කරන ලද විගණන විමසුම් ප්‍රකාරව රු.33,567,978 ක මුදලක් ප්‍රතිදාන වශයෙන් අයකර ගත යුතු බව නිරීක්ෂණය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට ඉන් අයකර ගෙන තිබුණේ රු.8,929,101 ක් හෙවත් සියයට 26 ක ප්‍රතිශතයක් පමණි. එබැවින් රු.24,638,877 ක වටිනාකමක් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ට) නව ටිකට් යන්ත්‍රයක වර්තමාන වෙළඳපොල වටිනාකම රු.38,000 ක් පමණ වන පසුබිමක 2023, 2024 සහ 2025 වර්ෂයන් වලදී අළුත්වැඩියා අවස්ථා 21,079 වෙනුවෙන් රු.179,455,867 ක පිරිවැයක් මණ්ඩලය දරා තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ සමස්ථ යන්ත්‍රෝපකරණ නඩත්තු හා අළුත්වැඩියා වියදමින් සියයට 96 ක ප්‍රතිශතයක් විය. එලදායී ජීව කාලය ඉක්මවා තිබූ මෙම ටිකට් යන්ත්‍ර භාවිතයෙන් ඉවත්කර නව ටිකට් යන්ත්‍ර මිලදී ගැනීම කෙරෙහි මණ්ඩලයේ නිසි අවධානය යොමු වී නොතිබුණි.

